**ජාතික ක්‍රීඩා අරමුදල - 2021**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**--------**

ජාතික ක්‍රීඩා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2ක් ඉක්ම වූ එකතුව රු.260,000 ක ආරක්ෂක ඇප තැන්පතු 26ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ආරක්ෂක ඇප තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කරන ලෙස අදාල පාර්ශව දැනුවත් කර ඇති අතර මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 877 (1) (ඈ) ඡේදය | 2021 වර්ෂයේ ජාතික ක්‍රීඩා අරමුදල් අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේ සිට නිවැරදි කිරීමට සටහන් කරගන්නා ලදී. | අරමුදල් අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි 877 (2) (ඈ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේ සිට නිවැරදි කිරීමට සටහන් කරගත් අතර 2022 අදාලව නව අයවැය අනුව සංශෝධනය කරනු ලබන අයවැය වාර්තාවෙහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත යැවීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | කාර්යසාධන වාර්තාවක් පිළියෙල කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදයේ 1.2 | සමාලෝචිත වර්ෂයේදී ජාතික ක්‍රීඩා අරමුදලේ පරිපාලන කටයුතු වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරීන් 08 දෙනෙකු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරුවන් 03 දෙනෙකු වෙත ගෙවන ලද රු. මිලියන.1.9 ක් වූ දීමනා සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය පමණක් ලබා ගෙන තිබුණි. | ක්‍රීඩා අරමුදලට අදාලව ගෙවීම් කිරීම සම්පූර්ණයෙන්ම අමාත්‍යතුමාගේ අනුමැතිය මත සිදු වන කරුණක් වන අතර පනත ප්‍රකාරව එම බලතල ක්‍රියාත්මක කිරීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවේ. ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගත යුතුද යන්න පිළිබඳ නීතිපති විමසීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය නිලධාරීන් වෙත දීමනා ගෙවීමේදී ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගත යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 12,466,552 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 79,788,742 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.92,255,294 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අරමුදලේ ආදායම රු.164,720,372 වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රමණතා විශ්ලේෂණය**

2018 හා 2019 වර්ෂවල පැවති ඌනතාවය පිළිවෙලින් රු. 26,110,111ක් හා රු. 6,495,405ක් වූ අතර 2020 වර්ෂය වන විට රු. 49,928,743ක් වූ ආදායම මෙන් තුන් ගුණයකට ආසන්න රු. 127,717,485ක්ව වියදමක් පැවතීම හේතුවෙන් රු. 77,788,742ක මූල්‍ය ඌනතාවයක් පැවතුණි. මෙම වර්ෂ තුනෙහි මූල්‍ය කාර්යසාධනයේ පසුබෑමක් දක්නට ලැබුණද 2021 වර්ෂයේදී ආදායම රු. 212,649,115ක් හා වියදම රු. 200,182,563ක් වූයෙන් රු. මිලියන 12කට අධික මූල්‍ය අතිරික්තයක් ලගා කරගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශනය අනුව වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කරගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන බව දන්වා තිබුණි. එසේ වුවද | ක්‍රීඩා අරමුදලේ මුදල් යෙදවිය යුතු කාර්යන් අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම ප්‍රධාන කාර්යක් ලෙස විශේෂයෙන් ඇතුළත් කර නොමැත. | ක්‍රීඩකයන්ගේ කාර්ය සාධනය වර්ධනය කිරීම සඳහා පෝෂණ තත්ත්වය ඉහල දැමීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු. මිලියන 200.1 ක් වූ මුළු වියදමින් සියයට 02ක් වූ රු. මිලියන 4 ක් පමණක් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා වියදම් කර තිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කෞශලායන් වර්ධනය කොට ජාත්‍යන්තර දක්ෂතා ඉලක්ක කර ගනිමින් ආරම්භ කොට ඇති උසස් දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් 60ක් සඳහා මාසිකව රු. 25,000ක පොෂණ මල්ලක් ප්‍රදානය කිරීමට අදාලව අනුග්‍රහකත්වය ලබා දීමට පුද්ගලික ආයතනයක් එකඟතාවය පලකර රු. මිලියන 9 ක් ජාතික ක්‍රීඩා අරමුදල වෙත බැර කර තිබුණි. මේ අනුව අනුග්‍රාහක ආයතනයෙන් ලද රු. මිලියන 9 ක මුදලින් ක්‍රීඩකයින් 54 දෙනෙකු වෙත මාස 03ක කාලයක් සඳහා රු. මිලියන 4 ක් පමණක් වැය කර විදේශගතව ක්‍රීඩා පුහුණුව ලබන ක්‍රීඩකයන් දෙදෙනෙකු සඳහා දිරි දීමනා ලෙස රු. මිලියන 4.2ක් ගෙවා තිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. | අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට මුලික කරගෙන අනුග්‍රාහක අරමුදල් නියමිත කාර්යය සඳහාම භාවිතා කල යුතු වීම. |
| (ඇ) | 2020 ටෝකියෝ පැරාලිම්පික් තරඟාවලියේදී රන් හා රිදී පදක්කම් දිනා ගත් ක්‍රීඩකයන් දෙදෙනෙකු හා ඔවුන්ගේ පුහුණුකරුවන් වෙත ජාතික ක්‍රීඩා සභාවේ නිර්දේශය පරිදි මුල්‍ය ත්‍යාග ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 96ක් වූ ප්‍රතිපාදන ලබා දී රු. මිලියන 91.1 ක් ගෙවා තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් නොවූ විශේෂ දක්ෂතා දැක්වූ තවත් ක්‍රීඩකයන් 05 දෙනෙකුට හා ඔවුන්ගේ පුහුණුකරුවන් වෙත රු. මිලියන 8.1 ක් ගෙවා තිබුණි. | ජාත්‍යන්තර තරඟ වල දී ජයග්‍රහන ලබාදුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ප්‍රතිලාභ ලබා දීම ක්‍රීඩා සභාවේ මාර්ගෝපදේශය මත පදනම් ව ක්‍රීඩා අරමුදල මගින් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සිදු කරනු ලැබේ. ක්‍රීඩා පනතේ විධිවිධාන පරිදි අමාත්‍යවරයා සතු බලතල අනුව ගෙවීම් සිදු කර ඇත . | රන්,රිදී හා විශේෂ දක්ෂතා දැක් වූ ක්‍රීඩකයන් සියළුදෙනා සඳහා තිලිණ ප්‍රදානය කරන්නේ නම් ඒ සඳහා විධිමත් පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වීම. |
| (ඈ) | දැනට පවතින ක්‍රීඩා පාසල්වල භෞතික සම්පත් ලබා දීම සම්බන්ධ යෝජනාවකට අනුව අත්‍යවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ මූලික උපකරණ මිල දී ගැනීමට සහ ප්‍රවාහනයට ක්‍රීඩා අරමුදල මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2020 වර්ෂයේ රු. මිලියන 5 ක් ලබා දී තිබුණද රු. මිලියන 4.6 ක් පමණක් ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමට යොදාගෙන තිබුණි. | අදාල තොරතුරු ඉදිරිපත් කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සිහිකැඳවීමක්ද යවා තිබූ නමුත් අදාල තොරතුරු ඉදිරිපත්වී නොමැත. මේ පිළිබඳ පසු විපරම් කටයුතු කඩිනමින් සිදු කරනු ලැබේ. | වෙනත් රාජ්‍ය ආයතන වෙත ප්‍රතිපාදන ලබාදිමේදී එහි කාර්ය සාධනය සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කළ යුතු වීම. |
| (ඉ) | පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල හා ආසියානු ක්‍රීඩා උළෙල ඉලක්ක කරමින් උසස් කාර්ය සාධන වැඩසටහන යටතේ | ජාතික ක්‍රීඩා සභාවේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත අදාල ප්‍රතිපාදන | ජාත්‍යන්තර ක්‍රීඩා උළෙලවල් ඉලක්ක කර ක්‍රීඩකයින්ගේ කාර්ය සාධනය වර්ධනය |

| | | | |
|---|---|---|---|
| | ක්‍රීඩකයන්ගේ හැකියාවන් වර්ධනය කර අදාල තරඟ ජයග්‍රහණය කිරීම අපේක්ෂාවෙන් ක්‍රීඩාවන් 6 ක් සඳහා තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණු කරුවන් සඳහා ජාතික ක්‍රීඩා අරමුදල මගින් 2021 මාර්තු සිට දෙසැම්බර් දක්වා රු. මිලියන 75.2 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. නමුත් එම ගෙවීම සඳහා ක්‍රීඩකයන් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය හා එයට අදාල නිර්නායකයන් තීරණය කිරීමකින් තොරව ගෙවා තිබුණි. | ජාතික ක්‍රීඩා අරමුදලින් නිදහස් කර ඇති අතර අදාල ආයතන සම්බන්ධ කරගනිමින් මේ පිළිබඳව ඉදිරියේදී සවිස්තරාත්මක වාර්ථාවක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. | කිරීම සම්බන්ධ පහසුකම් සැලසීමේදී විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු වීම. |
| (ඊ) | ජාතික ඔලිම්පික් කමිටුව විසින් 2021 වර්ෂයේ සය මාසික පූර්ණ ශිෂ්‍යාත්වයක් මත පුහුණු කටයුතු සඳහා විදේශගත කර තිබුණු ක්‍රීඩකයෙකුට උසස් කාර්ය සාධන වැඩසටහන යටතේ මාස 10ක කාලයක් සඳහා රු. මිලියන 1 ක දීමනාවක් සහ රු. 75,000ක පෝෂණ දීමනාවක් ගෙවා තිබුණි . එයට අමතරව විදේශගතව පුහුණුව ලබන තවත් ක්‍රීඩකයෙකු වෙත මාස 03ක් සඳහා රු. 300,000ක් ද ඉතිරි මාස 07ක් සඳහා ඇ. ඩො. 1500 බැගින් රු.මිලියන 2 ක් ද ජාතික ක්‍රීඩා අරමුදලෙන් ගෙවා ඇතත් එම ක්‍රීඩකයන් දෙදෙනා පුද්ගලික හේතුවක් මත බව දක්වමින් 2022 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල නියෝජනය කර නොතිබුණි. | ජාතික ක්‍රීඩා සභාවේ නිර්දේශ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත අදාල ප්‍රතිපාදන ජාතික ක්‍රීඩා අරමුදලින් නිදහස් කර ඇති අතර අදාල ආයතන සම්බන්ධ කරගනිමින් ඉදිරියේදී මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්ථාවක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. | විශේෂ පුහුණුව ලබන ක්‍රීඩකයන් ජාත්‍යන්තර තරඟ වලට සහභාගි කරවීමේ විධිමත් වැඩපිළිවෙළක් සකස් කල යුතු වීම |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------------- | ------------- |
| (අ) | 1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනතේ 22 වන වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්යය දීම, ඒවා දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවා තිබුණි. නමුත් මෙතෙක් ශ්‍රී ලංකාව සහභාගි වූ ඔලිම්පික් ක්‍රීඩා උළෙලවල් 19කදී රිදී පදක්කම් 02ක් පමණක් දිනාගෙන තිබුණ අතර 201/8 වර්ෂයේ පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙලේදී ලබාගෙන තිබූ ලෝකඩ පදක්කම් 05 2022 වන විට ලෝකඩ පදක්කම් 03 දක්වා පහළ බැස තිබුණි. | එකග වේ. | ක්‍රීඩා අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උසස් කාර්ය සාධන වැඩසටහන යටතේ දීමනා ලබා ගත් ක්‍රීඩකයින් 35 දෙනෙකු පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා තෝරාගෙන නොතිබුණු අතර, ක්‍රීඩා උළෙල සඳහා අනුමැතිය හිමි වූ ක්‍රීඩකයන් 14ක් වෙත දීමනාව ලබා දී නොතිබුණි. | ජාතික ක්‍රීඩා සභාවේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත අදාල ප්‍රතිපාදන ජාතික ක්‍රීඩා අරමුදලින් නිදහස් කර ඇති අතර අදාල ආයතන සම්බන්ධ කරගනිමින් මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්ථාවක් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ලැබේ. | ඉහල දක්ෂතා පෙන්වන ක්‍රීඩකයන් සඳහා දීමනා ලබාදීම සම්බන්ධව කටයුතු කල යුතු වීම. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දේශීය වශයෙන් හා අන්තර්ජාතික වශයෙන් ලබාගන්නා කුසලතා ශ්‍රේණිගත කිරීම් හා ජයග්‍රහණ සම්බන්ධව දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට යාවත්කාලීන කරමින් පවතී. | ක්‍රීඩා තොරතුරු ඇතුළත් වෙබ් අඩවිය යාවත්කාලීන කල යුතු වීම. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලන අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරය සඳහා ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේදී ජාතික ක්‍රීඩා අරමුදල මගින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු. මිලියන 9.1 ක් ලබැ දී තිබුණ අතර මුළු වියදම රු. මිලියන 7.3ක් වූයෙන් ඉතිරි මුදල වූ රු. මිලියන 1.9 ක් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධ වාර්තා අරමුදල වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල කාර්යයන් ඉටු නොකරන්නේ නම් ඉතිරි මුදල් යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | වෙනත් රාජ්‍ය ආයතන මගින් සංවර්ධන කටයුතු සිදු කිරිමේදී ලබාදෙන ප්‍රතිපාදන සම්බන්ධ විධිමත් පසු විපරම් කටයුතු සිදු කළ යුතුය. |